# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2300/06 - 2022 ඔක්තෝබර් මස 03 වැනි සඳුදා - 2022.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ හොරණ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

2012 අංක 21 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 169 වන වගන්තිය ප්‍රකාරව සභාපති ධුරයෙන් ඉල්ලා අස්වූවා සේ සළකනු ලැබීම හේතුකොට ගෙන හොරණ ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ තනතුරු දැරූ සභාපති වන අනිල් අශෝක රණතුංග අයත්වන්නාවූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත්වන්නා වූ ද, එම හොරණ ප්‍රාදේශීය සභාවේ සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා දිලිප් පුෂ්පකුමාර වීරක්කොඩි නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

හොරණ ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී වන්නකුවත්ත වඩුගේ කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66ආ(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, දිලිප් පුෂ්පකුමාර වීරක්කොඩි, හොරණ ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරාපත් කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු,**
තේරීම්භාර නිලධාරී,
හොරණ ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 30 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කළුතර

EOG 10 - 0005

1A - G 37632— 26 (2022/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

උපසභාපති, සභාපති වශයෙන් පත්වීම හේතුකොට ගෙන ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ උපසභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ තනතුරු දැරූ උපසභාපති වන හේමන්ත චන්ද කුමාර රත්වත්ත අයත්වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත උපසභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත්වන්නා වූ ද, එම ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ උපසභාපති පිළිබඳ තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා අදිකාරී මුදියන්සේලාගේ රත්නායක අධිකාරී නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කෙංගාදරන් මුගුන්දන් වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66ආ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අදිකාරී මුදියන්සේලාගේ රත්නායක අධිකාරී, ඉපලෝගම ප්‍රාදේශීය සභාවේ උපසභාපති වශයෙන් තෝරාපත් කරගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**කේ. මුගුන්දන්,**
තේරීම්භාර නිලධාරී,
ඉපලෝගම ප්‍රාදේශීය සභාව.

2022 සැප්තැම්බර් මස 30 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අනුරාධපුර.

EOG 10 - 0006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.